# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,196 — 1960 සැප්තැම්බර් 9 වැනි සිකුරාදා — 9.9.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 685 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 690 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 690 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 699 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 701 |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායසී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනු කූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධ්‍යනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

දරන්නෙකු ලොකු පාසලක හෝ කුඩා පාසලක මුල් ගුරුවරයෙකු වශයෙන් හෝ වැටුප් ඌණතාවයක් නොමැතිව එම දෙවර්ගයේම පාසලක උපගුරුවරයෙක් හෝ විය හැකිය.

පැරණි ක්‍රමය යටතේ 1957.2.1 වන දින හෝ ඊට ප්‍රථමයෙන් කුඩා පාසල් වල මුල් ගුරු මහතුන් වශයෙන් හෝ ගුරුවරියන් 10 දෙනෙකු සඳහා හිමිකම් ඇති පාසල් වල ජ්‍යෙෂ්ඨ උපගුරු මහතුන් වශයෙන් හෝ පත් කරන ලද රජයේ සිංහල ගුරුමහතුන් සහ 1.5.57 දින හෝ ඊට ප්‍රථමයෙන් කුඩා පාසල් වල මුල් ගුරුවරියන් ලෙස හෝ II වන ශ්‍රෙණියේ ගුරුවරියන් වශයෙන් පත් කරන ලද ගුරුවරියන් ද 1960. 4. 1 වන දින සිට I වන ශ්‍රේණියට උසස් කර තිබේ. 1960. 4. 1 වන දින සිට පහත සඳහන් වන අන්දමට ඔවුන් ගේ අධ්‍යාපන සුදුසුකම් අනුව නියමිත වැටුප් ක්‍රමයන් හි ඔවුන් පිහිටවනු ලැබේ :—

පුහුණු I වැනි පෙළ : රු. 1,776—72 හා 120—රු. 3,360.

නුපුහුණු I වැනි පෙළ : රු. 1,728—72—රු. 2,520.

මෙම නිවේදනය අනුව මෙහි පහත සඳහන් වන කාණ්ඩවලට අයත් ගුරුවර වරියන් තත්වයෙන් උසස් වීම් සඳහා ඉල්ලුම් කළ යුතු නොවේ :—

(අ) පිළිවෙළින් II වැනි ශ්‍රේණියට හෝ I වැනි ශ්‍රෙණියට උසස් වීමට හිමිකම් ඇති හා එවැනි උසස් වීමක් ලබා තිබෙන උප ගුරුවරුන් හෝ II වැනි ශ්‍රේණියේ ගුරුවරුන්.

(ආ) පූර්වෝක්ත සුදුසු කම් නොලත් ගුරුවර වරියන්.

2. ඉහත සඳහන් වූ අන්දමට සුදුසුකම් නොලත් සියලුම ගුරුවර/වරියන් විසින් පහත අසා තිබෙන විස්තර කොළඹ 2, මලයි විදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ස්ථාන මාරුවීම් ශාඛාවේ, ඩබ්ලිව්. ඩී. ඩී. මහතන්තිල මහතාගේ පෞද්ගලික ලිපිනයට එවිය යුතුයි.

එස්. එෆ්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

1960 අගෝස්තු මස 31 වන දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

## I වැනි ශ්‍රේණියට/II වැනි ශ්‍රේණියට උසස් වීම සඳහා ඉල්ලුම් කිරීම
(අනවශ්‍ය කොටස් කපා හරින්න)

1. ගුරුවරයාගේ/ගුරුවරියගේ නම :————.

2. ලියා පදිංචි කළ අංකය :————.

3. දනට දරන තනතුර :—

4. දිස්ත්‍රික් සංකේතය සහිතව පාසලේ නම :————.

5. අධ්‍යාපන සුදුසුකම් :————.

6. I වැනි පෙළ සහතිකය ලත් දිනය :————.

7. රජයේ සේවයට බැඳුණු දිනය :————.

8. ජ්‍යෙෂ්ඨතා අංකය :————.

9. දනට ලැබෙන වැටුප් ක්‍රමය :————.

10. දනටමත් II වන ශ්‍රෙණියට උසස් කර තිබේ නම් මේ කාර්යාල යෙන් ලැබූ ලියුම්වල අංක හා දිනයන් සමග උසස් කරනු ලැබූ දිනය හා සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

11. ඔබ මුල් ගුරුවරයෙකුගේ රාජකාරිය කිරීම සඳහා පත් කර තිබේ නම් ඔබට රු. 25 හේ මාසික දීමනාව ලැබෙන්නෙහිද කියාත් එසේ නම් කවර දින සිටද කියාත් සඳහන් කරන්න. තවද එම දීමනාව ගෙවීමට අවසරදීමේ ලියුමේ අංකය හා දිනයද සඳහන් කරනු මැනවි :————.

පූර්වෝක්ත විස්තර නිරවද්‍ය බවත් මා ඉල්ලුම් කරන ශ්‍රේණියට උත්තීර්ණ වී නොමැති බවත් මෙයින් සහතික කරමි.

————,
ගුරුවරයාගේ/වරියගේ අත්සන.

දිනය :————.

පිරික්සූ බවට හා නිවැරදි බවට සහතික කරමි.

————,
මුල් ගුරු මහතා/මහත්මියගේ අත්සන.

දිනය :————.

## අලෙවි කිරීමේ සංවර්ධන දෙපාර්තමේන්තුව

### ලෝටස් පාරේ ශීත ගබඩාවේ ෆෝර්මන් තනතුර

ලෝටස් පාරේ පිහිටි ශීත ගබඩාවේ ෆෝර්මන් තනතුරු සඳහා අයදුම් පත් භාර ගනු ලැබේ.

2. වැටුප් පරිමාණය.—වර්ෂයකට රු. 3,180 පටන් ගෙන 120 බැගින් 6 වරක් ද සහ 180 බැගින් 8 වරක් ද වැඩිවී වර්ෂයකට 5,340 දක්වා වැඩිවේ.

3. වයස් සීමාව—වයස අවුරුදු 21කට අඩු නොවිය යුතු අතර, අවුරුදු 40කට වැඩි නොවිය යුතුයි. දැනට රජයේ සේවයේ සිටින්නන්ට වයස් සීමාව බල පවත්වන්නේ නැත.

4. අධ්‍යාපනික සුදුසුකම්.—(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක් සමග පිළිගත් වෙළඳ සමාගමක විදුලි කර්මාන්ත සහ ශීතකර පිළිබඳ අවුරුදු 3ක් ආධුනිකත්වය තිබීම, සහ

පිළිගත් වෙළඳ සමාගමක් යටතේ, විදුලි කර්මාන්තය සහ ශීතකර පිළිබඳව, පුහුණුවීමේ කාලය හැර අවුරුදු 8 ක පළපුරුද්දක් තිබීම, හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් ගේ පාඩම් මාලාව සතුටුදායක අන්දමින් සම්පූර්ණ කිරීම සහ පිළි ගත් වෙළඳ සමාගමක් යටතේ විදුලි කර්මාන්තය සහ ශීතකර පිළිබඳ අවුරුදු 6ක පළපුරුද්දක් තිබීම (පුහුණු වීමේ කාලය හැර).

5. සේවා කොන්දේසි.—මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිත තාව කාලික තනතුරකි. මෙම තනතුර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ උප ලේඛන ගතව තිබේනම්, රා. සේ. අ. අර මුදලට දායක මුදල් අයකරගනු ලැබේ.

6. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් අය දුම්පත සමග අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය.
(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය.
(ඇ) කාර්මික සහ වෘත්තීය පිළිබඳ සහතික, සහ
(ඈ) ළඟදී ලබාගත් චරිත සහතික තුනක්.

7. ගැසට් පත්‍රයේ I වෙනි කාණ්ඩයේ II වෙනි කොටසේ පළවී ඇති, රාජ්‍ය සේවාවන්ට අනුකූල සාමාන්‍ය නියමයන් කෙරෙහි ඔබේ අවධානය යොමු කළ යුතුය.

8. පහත සඳහන් ආදශී අයදුම් පත පරිදි පිළියෙල කරගන්නා ලද අයදුම් පත් 1960.9.19 දින හෝ ඊට පෙර, අලෙවි කිරීම් සංවර්ධන කොමසාරිස් තුමා, 62, චැතම් වීදිය, කොළඹ 1 යන ලිපිනයට එවිය යුතුය. දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කිසිම නිලධාරියෙකු ගේ පෞද්ගලික ලිපිනයට නොඑවිය යුතුය.

අයදුම් පත් ලද බැව් දන්වා එවනු නො ලැබේ.

අලෙවි කිරීමේ සංවර්ධන කොමසාරිස්.

1960. 9. 2 දින,
කොළඹ, අලෙවි කිරීමේ සංවර්ධන දෙපාර්තමේන්තුවේදීය.

## ඉල්ලුම් පත්‍රය

### ලෝටස් පාරේ පිහිටි ශීත ගබඩාවේ ෆෝර්මන් තනතුර

(අයදුම් පත් ඉදිරිපත් කරන විට සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුය. මූලික පිටපත් එවා නැති වුවහොත් ඒවා ගැන දෙපාර්තමේන්තුව වග කීමට බැඳී නැත.)

1. සම්පූර්ණ නම (පැහැදිළි අකුරෙන්) :————.
2. ස්ථිර ලිපිනය :————.
3. වයස සහ උපන් දිනය :————.
4. උපන් ස්ථානය :————.
5. (අ) ජාතිය :————.

(ආ) ලංකා පුරවැසියෙක් ද යන බව සඳහන් කරන්න :————
1. උප්පත්තියෙන්ම,
2. ලියාපදිංචි විමෙන්,

6. විවාහක ද අවිවාහක ද යන වග :————.
7. අධ්‍යාපනික සුදුසුකම් :————.
1. සිංහල
2. දෙමළ
3. ඉංග්‍රීසි.

8. කාර්මික හා වෘත්තීය පිළිබඳ සුදුසුකම් සහ පළපුරුද්ද :——.
9. දැනට තනතුරක් දරන්නේ නම් එය :————.

————
අයදුම් කරුගේ අත්සන.

දිනය :————.

## ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව

### ඖෂධ ගබඩා පාලක තනතුරක්

ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ඖෂධ ගබඩා පාලක තනතුරක් සඳහා ඉල්ලුම් පත් මෙයින් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1960 සැප්තැම්බර් 30 වැනි දාට හෝ ඊට පෙර මා වෙත එවිය යුතු යි.

2. වැටුප.—වර්ෂයකට රුපි. 1,620 න් පටන් ගෙන රුපි. 120 ක වාර්ෂික වැඩිවීමක් ඇතිව රු. 3,060 න් අවසන් වැටුප් ක්‍රමයක් මේ තනතුරට හිමිය.

3. **සේවා කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මේ තනතුර තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් ය. ස්ථිර තනතුරක් දරණ නිලධාරියකු තෝරා ගතහොත් පටන් ගැනීමේදී නියමිත කාල පරිච්ඡේදයකට වැඩ බැලීමට පත් කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—

සෑම අයදුම්කරුවකු විසින් පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1960 සැප්තැම්බර් 30 වැනිදාට වයස අවුරුදු 21ට නො අඩු 35ට නොවැඩි විය යුතුයි.

(ආ) ලංකාවේ හෝ ඉන්දියාවේ පිළිගත් ආයතනයක් මගින් ප්‍රදානය කරන ලද වෛද්‍ය උපාධියක් දරන්නකු විය යුතු අතර, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා අවබෝධයක් ලැබුවකු හා යටත් පිරිසෙයින් ඖෂධ ගබඩා පාලනය පිළිබඳ පස් අවුරුදු කාල සීමාවක පළපුරුද්දක් ලබා ඇති අයකු විය යුතුයි.

(ඇ) විශිෂ්ඨ චරිතයක් සහ මනා ශරීර ශක්තියෙකින් යුක්ත විය යුතුය.

5. අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පිටපත් (මුල් සහතික නොවේ.) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (බවුතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරන ලද සහතික පත් බාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) මෑතක දී ලබා ගන්නා ලද චරිතය පිළිබඳ සහතික දෙකක්.

6. තෝරා පත් කර ගන්නා ලද අයදුම්කරු විසින් රු. 500ක ඇප මුදලක් තැබිය යුතුය.

7. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර හා ඒ පිළිබඳ වූ වෙනත් ලිය කියවිලි ස්වදේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධන කොමසාරිස් තුමාගේ නිල නාමයට මිස මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන කිසියම් නිල ධාරියකුගේ පුද්ගලික නාමයට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වෙනි ඡේදයේ මූලාරම්භයේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම පිළිබඳ පොදු කොන්දේසිවලට ඔබේ අවධානය මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
සවදේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධන
කොමසාරිස්.

ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ 8—1960 අගෝස්තු 30 වැනි දා.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**සවදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ**
**ඖෂධ ගබඩා පාලක තනතුරක්**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) පෙළපත් නාමය :—.
   (ආ) අනික් නම් :—
2. ලිපිනය :————.
3. උපන් දිනය සහ ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපත ඇමිණිය යුතුය.) :————.
   1960 සැප්තැම්බර් 30 දිනට සම්පූර්ණ වයස : අවුරුදු :— මාස :— දින :—
4. ජාතිය :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි.)
6. වෘත්තීය සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි.)
7. ගබඩා පාලනය පිළිබඳ පළ පුරුද්ද :————.
8. වෙනත් සුදුසුකම් :————.

මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද නිවැරදි බවද මෙයින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණහොත් මා පත්වීම ලැබීමට නුසුදුස් සකු වන බවද, පත්වීමට පසු දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද මම **දනිමි.**

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### සුළු පරිපාලක II ශ්‍රේණියේ ඕවර්සියර් තනතුරු

කොළඹ වරාය කොමිෂන් සභාවේ ගොඩනැගිලි අංශයේ වූ ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ පෝර්මයට අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1960 සැප්තැම්බර් මස 23 වැනි දිනට හෝ එයට පෙර පහත අත්සන් කරන අය වෙත ලැබිය යුතුය.

2. **වැටුප.**—මෙම තනතුරට හිමි වාර්ෂික පඩිය රු. 960 කි. නියමිත වැටුප් ක්‍රමය මෙසේ ය :—වසකට රුපියල් 960 න් පටන්ගෙන රුපියල් 42 ගණනේ වැඩිවීම් ඇතුව රුපියල් 1,752 දක්වා නගී. රජයේ නීතිරීති අනුව ජීවනාධාර මුදල් සහ විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ.

3. මෙම තනතුර සථිරය. තෝරා ගනු ලබන අයදුම්කරු තුන් වර්ෂයක් ආධුනිකත්වයේ තබනු ඇත. ආධුනික කාලය ඇතුලත ඔවුන්ගේ වැඩ අසතුටු බව පෙනී ගියහොත් සේවය නැවැත්විය හැකිය. ආධුනික කාලය සතුටුදායක වී නම් ඒ අවසානයේදී ඔවුන් සථිර කරනු ලැබේ.

4. තෝරා ගනු ලබන අයදුම්කරු කෙටි දැනුම්දීමකින් වැඩ භාර ගැනීමට සුදානම් විය යුතුය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවකු හටම පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතුවේ :—

(අ) වයස අවුරුදු 25 ට වැඩි විය යුතුයි.

(ආ) හත්වෙනි ප්‍රමාණයෙන් සමත්වී තිබිය යුතු අතර ඉංග්‍රීසියෙන් වැඩ කිරීමේ දැනීමක් තිබිය යුතුය.

(ඉ) ගොඩනැගිලි තැනීම හා නඩත්තු කිරීම, රීන්පෝර්ස්ඩ් කොන්ක්‍රීට් වැඩ, (ගොඩනැගිලි සඳහා වූ ලිහිලි රීන්පෝර්ස්ඩ් වැඩ හැරෙන්ට) රාශි (මාස්) කොන්ක්‍රීට්වැඩ, භූමිවැඩ, ගොඩනැගිලි වානේ වැඩ, දැව සවි කිරීම ඇතුළු කැනීමේ වැඩ, ගොඩනැගිලි සඳහා වූ ජල සම්පාදන සේවය හා කසල කානු වැඩ, පිළිබඳව, යටත් පිරිසෙයින් අවුරුදු 7 ක පළපුරුද්දක් තිබිය යුතුය. බුල්ඩෝසර්, සම්පීඩක, (කොම්ප්‍රේෂර්) නිව්මැටික් බ්‍රෙකර්, කොන්ක්‍රීට් මික්ස්ර් වැනි සිවිල් ඉංජිනේරු ගොඩනැගීමේ යාන්ත්‍රාගාර පාවිච්චිය ගැන සහ බඩු ඇනවුම් කිරීම හා බඩු ගණන් තැබීම ගැන අතිරේක පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂයෙන් සලකනු ලැබේ. මෙම 7 අවුරුද්දේ පළපුරුද්දෙන් යටත් පිරිසෙයින් අවුරුදු 3 ක්වත් කෙලින්ම කම්කරු පාලනය සහ නඩත්තු හා අළුත්වැඩියා කිරීම් වැඩ ගැන ද්‍රව්‍ය ප්‍රමාණයන් තක්සේරු කිරීමේ පළපුරුද්ද තිබිය යුතුය.

(ඊ) හොඳ චරිතයක් ඇති විය යුතු අතර හොඳ ශරීර සෞඛ්‍යය කින් ද සමන්විත විය යුතුය.

6. තම චරිතය පිළිබඳව හා තනතුරට පත් කර ගැනීම සඳහා යෝග්‍යතාවය දක්වෙන අළුත්ම සහතික තුනක පිටපත් අයදුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය.

7. ඉහත සඳහන් 5 වෙනි ඡේදය අනුව සුසුදුකම් ඇති දනට රජයේ සේවාවෙහි යෙදී සිටින නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාගීයෙනී. නියමිත දිනට කලින් ලැබූ ඉල්ලුම්පත්, ප්‍රමාදවීම සඳහා පිළිගතහැකි වලංගු කරුණු ඉදිරිපත් කරමින් බාරගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ කරන ඉල්ලුම් පත්‍ර විනා, අතිකුත් ඉල්ලුම් පත්‍ර නියමිත දිනට පසුව භාරගනු නොලැබේ.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ II වෙනි ඡේදයේ රාජ්‍යසේවාව මගින් ප්‍රථමයෙන් ප්‍රසිද්ධ කරන ලද තනතුරු ඉල්ලුම් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ඉල්ලුම් කරුවන්ගේ සැලකිල්ලට යොමු විය යුතුයි.

9. මේ දැන්වීමේ සඳහන් නියමයනට කවර ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වනු නොලැබේ.

10. ඉල්ලුම් පත්‍රය හා වෙනත් මේ පිළිබඳ වූ සෑම ලියමනක් ම වරාය කොමසාරිස් තැන වෙත එවිය යුතු අතර මේ පිළිබඳ වූ ලියුම් කිසිවක් දෙපාර්තමේන්තුවේ කවර නිලධාරියෙකුගේ හෝ පෞද්ගලික ලිපිනයට නොඑවිය යුතුය.

ආර්. ඒ. අබයසේකර,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1960 සැප්තැම්බර් 2 දින,

## ආදර්ශ පෝර්මය

## කොළඹ වරාය කොමිෂන් සභාව

**සුළු පරිපාලක II ශ්‍රේණියේ ඕවර්සියර් තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ ආකෘතිපත්‍රය**

1. සම්පූර්ණ නම (ලොකු අකුරින්) :————.
2. උපන් දිනය හා වයස :————.
3. අධ්‍යාපන සුදුසුකම් :————.
4. ඔබට, ඉංග්‍රීසියෙන් වැඩ කිරීමේ දැනුමක් තිබේද ? :————.
5. කාර්මික සුදුසුකම්, යමෙක් තිබේනම් :————.
6. කලින් පළපුරුද්ද (කෙටියෙන් සඳහන් කරනු) :————.
7. වෙනත් විශේෂ සුදුසු කම් :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**සැළකිය යුතුයි.**—ඉල්ලුම් පතට ඇමිනිය යුත්තේ සහතිකවල පිට පත් පමණකි. ඇමුනු මුල් පිටපත් නැතිවූයේ නම් දෙපාර්තමේන්තුව ඒ ගැන වගකීමක් නොමැත.

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

**ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බෙදාදී ඇති බිම්කට්ටි ඕවර්සියර් තනතුරු**

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දෙවැනි ශ්‍රෙණියේ ඉඩම් කට්ටි ඕවර්සියර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය සහ බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැටුප—

(අ) II වන ශ්‍රෙණිය : වසරකට රු. 750—42—1,086ක් වේ.
I වන ශ්‍රෙණිය : වසරකට රු. 1,044—42—1,380ක් වේ.

3. **අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික සුදුසුකම් සහ වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම ලාංකිකයෙකු විය යුතු අතර වයස අවුරුදු 24ට නොඅඩුවූද අවුරුදු 40ට නොවැඩිවූද අය විය යුතුයි.

අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම්ද තිබිය යුතුය :—

(1) (අ) කනිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන සහතිකයක්, සහ
(ආ) ගොවිකම් පාසැලක පුහුණුව ලැබූ බවට සහතිකයක් හෝ ආහාර නිෂ්පාදන ඕවර්සියර් කෙනකු වශයෙන් අවුරුදු දෙකක පුරුද්දක්, හෝ

(2) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තාවකාලික ඕවර්සියර් කෙනකු වශයෙන් අවුරුදු පහකට නොඅඩු සේවයක් ඇති, විෂයයන් වශයෙන් සිංහලය හෝ දෙමළ හෝ ඇතිව, ඉංග්‍රීසි 7 වැනි ප්‍රමාණයෙන් සමත්, වැඩ සහ හැසිරීම යහපත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තාවකාලික ඕවර්සියර්වරු.

(මෙම දිස්ත්‍රික්කයේ පදිංචි අවශ්‍ය සුදුසුකම් ඇති අයදුම්කරුවන් ගැන පළමුකොට සළකා බලා ඊට පසුව ඉඩම් කොමසාරිස් තැන විසින් විශෙෂයෙන් සඳහන් කරන තදාසන්න දිස්ත්‍රික්කවල පදිංචි අයදුම් කරුවන් ගැනද සළකා බලනු ලැබේ.)

4. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—තෝරා ගනු ලබන අයදුම්කරුවන් සඳහා අවුරුදු තුනක ආධුනික පරීක්ෂණ කාලයක් ඇත.

(අ) තෝරා ගත් අයදුම්කරුවන් පත් කිරීමට පෙර රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත් විය යුතුය.

(ආ) තෝරා ගත් අයදුම්කරුවන්ට බයිසිකලයක් වැනි සම්මත කළ වාහනයක් තිබිය යුතුය.

(ඇ) තෝරා ගත් අයදුම්කරුවන් රු. 250ට නොඅඩු ඇපයක් තැබීමට සූදානම් විය යුතුය.

(ඈ) පත්කරනු ලැබුවන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසද විශෙෂයෙන්ම 1956 අංක 33 දරණ රජයේ භාෂා පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම පිණිසද දැනට පනවා ඇති හෝ මින් මතුවට පණවනු ලබන හෝ ඕනෑම ව්‍යවස්ථාවකට අනුකූලව ක්‍රියා කළ යුතුය.

5. අයදුම්කරුවන් චරිතය සම්බන්ධයෙන් මෑතකදී ලබා ගන්නා ලද සහතික පත් දෙකක පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය.

6. නියමිත කර ඇති ආකෘති පත්‍රය ප්‍රකාර අයදුම් පත් සකස් කොට 60.9.23 දිනට හෝ ඊට පෙර බදුල්ලේ දිසාපති තැනට යැවිය යුතුය. ආකෘති පත්‍රයට අනුකූලව නොවූ අයදුම් පත් භාර ගනු නොලැබේ.

7. අයදුම් පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ පළවූ රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි බලනු මැනවි.

ඇල්. අයි. ජේ. සිල්වා,
බදුලු දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙනුවට.

1960 අගෝස්තු මස 30 වැනි දින,
බදුලු දිසාපති කාර්යාලයේදීය.

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බෙදා දී ඇති බිම්කට්ටි ඕවර්සියර් තනතුරු සඳහා අයදුම් ආකෘති පත්‍රය**

1. සම්පූර්ණ නම—
(අ) අගට යෙදෙන නම :————.
(ආ) වෙනත් නම් :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.

4. * උපන් දිනය සහ ස්ථානය—
(අ) ඉල්ලුම්කරුගේ :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුනා එවිය යුතුයි)
(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.
(ඉ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඊ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

5. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් අයදුම් පතට අමුනා එවිය යුතුයි)

6. ගොවිකම් හා ශාස්ත්‍රීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් අයදුම් පතට අමුනා එවිය යුතුයි)

7. අයදුම්කරුට ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බෙදා දුන් රජයේ බිම් කට්ටියක් තිබේද ? එවැනි ඉඩමක් තිබේ නම්—
(අ) එය පිහිටා ඇති ව්‍යාපාරයේ නම :————.
(ආ) බෙදා දී ඇති ප්‍රමාණය :————.
(ඊ) බෙදා දුන් දිනය :————.

8. වෙනත් සුදුසුකම් :————.

මේ අයදුම් පත්‍රයෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බවත්, මා උසාවියක වරදකරුවකු නොවී ඇති බවත් මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බව හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

* අයදුම්කරු ලංකාවේ උපන්නෙක් නම් (අ) හැර (ආ) හෝ (ආ) සහ (ඊ) යන දෙකම පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ ඉපදී නොමැති නම් (අ) හැර (ආ) සහ (ඉ) යන දෙකින් එකක් පිරවිය යුතුය.

---

## පැල්මඩුල්ල නානායමේ නානායම්කරු තනතුර

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතැන විසින් ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර 1960 ඔක්තෝබර් මස 5 වෙනි දින දවල් 12 දක්වා භාරගනු ලැබේ.

2. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 540 න් පටන් ගෙන අවුරුදුපතා රුපියල් 12 බැගින් වැඩිවී රුපියල් 804 තෙක් නගී. පහත සඳහන් දීමනා ද ලැබෙනු ඇත :—

(1) කුලීකරුවන්ගේ දීමනා මසකට රුපියල් 30 යි.

(2) රෙදි පිළි සේදීමේ දීමනා මසකට රුපියල් 17.50 යි.
(3) පහන් දැල්වීම සඳහා දීමනා මසකට රුපියල් 15 යි.

3. ඉල්ලුම්කරුවන් ලාංකිකයන් විය යුතුයි. සෑම අපේක්ෂක යෙකුටම ආහාර පිසීම පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුයි. සිංහල හෝ දෙමළ කියවන්නට සහ ලියන්නට පුළුවන් විය යුතු අතර ඉංග්‍රීසි කථා කිරීමට දැනුමක් තිබිය යුතුයි. දේශීය හා බටහිර ක්‍රම අනුව කෑම පිළියෙල කිරීමට ඇති පළපුරුද්ද අවශ්‍යතම සුදුසු කමකි. ආහාර පාන සැපයීමේ පලපුරුද්දක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. තානායම්වල ගණන් තැබීම දැන ගැනීම ද අවශ්‍ය සුදුසුකමකි. 1960 දෙසැම්බර් මස 31 වෙනි දිනට අවුරුදු 25ට නො අඩු වූද අවුරුදු 45කට නොවැඩි වූද අපේක්ෂකයන් පමණක් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතුයි.

4. මේ තනතුර සිස්ථිර විශ්‍රාම වැටුප් සහිත වූවකි. තෝරාගනු ලබන අපේක්ෂකයා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සාමාජික මුදල් ගෙවිය යුතුයි.

5. තෝරා ගනු ලැබූ අපේක්ෂකයා අවුරුදු 3ක අස්ථිර කාලයක් ගත කළ යුතුයි. තවද පත්කරගනු ලබන්නා විසින් රු. 750ක ඇපයක් ද තැබිය යුතුයි.

6. අයදුම්කරු විසින් මෙහි පහත සඳහන් ලියකියවිලිවල පිටපත් තම ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුයි :—

(1) උප්පැන්න සහතිකය,
(2) අධ්‍යාපන සහතික පත්‍ර, සහ
(3) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක්.

7. ආණ්ඩුවේ සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම් පත් සලකා බලනු ලබන්නේ ස්වකීය දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කළොත් පමණි.

8. අනියම් ලෙස උදව් සෙවීම හෝ පොළඹවා ගැනීමට හෝ තැත් කිරීම අයදුම්කරුවෙකු නුසුදුස්සෙකු කිරීමට හේතුවේ.

9. තෝරා ගැනීමට පෙර අයදුම් පත්‍රයෙහි සඳහන් යම් කරුණක් අසත්‍ය බව පෙනී ගියහොත් එයින්ම එකී අයදුම්කරුවා නුසුදුස්සෙකු බවට පත් වන අතර තෝරා ගැනීමෙන් පසු එවැන්නක් අනාවරණය වුවහොත් ඔහු රාජකාරියෙන් පහකර දැමීමට සිදු වේ.

10. අයදුම්කරුවන් නියම කරන දිනයක සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. ඒ සඳහා ගමන් ගාස්තු හෝ වෙනත් කිසිම වියදමක් හෝ ගෙවනු නොලැබේ.

ඇල්. බී. අබයරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති.

1960 සැප්තැම්බර් මස 2 වන දින,
රත්නපුර කච්චේරියේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1961 වර්ෂය සඳහා සාත්තු සේවා අභ්‍යාස විද්‍යාලවලට ආධුනික සාත්තු සේවිකාවන් බඳවා ගැනීම (ස්වභාෂා සහ ඉංග්‍රීසි)

වර්ෂ 1959 ජූලි 22 වැනි දින අංක 12,162 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළවූ 1960 ජූලි 18 වැනි දින දරණ දැන්වීම සම්බන්ධවයි.

එහි සඳහන් පරිදි මෙම විභාගය පවත්වනු ලබන්නේ 1960 සැප්තැම්බර් 24 වෙනි දින නොව 1960 ඔක්තෝබර් 1 වැනි සෙනසුරාදා බව මෙයින් නිවේදනය කෙරේ.

සී. පොන්නම්බලම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### සී. එල්. ඇෆ්. ටෙන්ඩර් දැන්වීමයි

ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 නොවැම්බර් 2 වෙනි දින පෙරවරු 11 දක්වා පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. නොවැම්බර් 3 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන බැවින්, ඒ සඳහා පැමිණ සිටීමට කැමති ටෙන්ඩර් කරුවන්ට එසේ කළ හැක :—

| ද්‍රව්‍ය | | ටෙන්ඩර් අංකය |
|---|---|---|
| (1) ට්‍රැක්ටර් ෂවල් යන්ත්‍ර | ... | සී. එල්. එෆ්. 64 |
| (2) තාර උණු කරන කේතල | ... | සී. එල්. එෆ්. 66 |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැන ගෙන් ටෙන්ඩර් ෆෝරම ලබාගත හැක. ටෙන්ඩර් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ ෆෝරම ලබාගැනීමට පෙර ටෙන්ඩර් කරුවන් විසින් තම තමන් නම් හා ලිපිනයන්ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 සැප්තැම්බර් 5 වැනි දින,
කොළඹ 2.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමන් විසින් මාතලේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ බඩු ගෙනයාම සඳහා ටෙන්ඩර් පත්‍ර ඔක්තෝබර් මස 5 වෙනි බදාදා පෙරවරු 10 වන තෙක් එතුමාගේ කාර්යාලයේ දී බාරගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 10,000කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි කළ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1. 9. 60 වෙනි දින සිට 3. 10. 60 වෙනි දින තෙක් මාතලේ වාරිමාර්ග කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක මේ වෙනුවෙන් රුපියල් 25ක මුදලක් තැන්පත් කොට රිසිට් පතක් මාතලේ වාරිමාර්ග උප කොට්ඨාශ භාර ඉංජිනේරු තුමා වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

දැනට ආණ්ඩුවේ කොන්ත්‍රාත් වැඩ කරගෙන යන කොන්ත්‍රාත් කරුවන් ඔවුන්ගේ වැඩකටයුතු ගැන හොඳින් කරගෙන යන්නේ යයි පැහැදිලි කිරීම පිණිස එම වැඩ භාර නිලධාරි තැනගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

මහනුවර මධ්‍යම දිසාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1960වේ ඔක්තෝබර් මස 5 වෙනි දින පෙරවරු 10.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කර ඇති කොන්ත්‍රාත් කරුවන්ට අවශ්‍යනම් එහි සිටිය හැක.

සී. තුරෙයිරාජසිංහම්,
මාතලේ උප කොට්ඨාශ භාර වාරිමාර්ග
ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය,
මාතලේ.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දක්ෂිණ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් 1960 ඔක්තෝබර් මස 11 වෙනි දින පෙරවරු 10 දක්වා පහත පළවන වැඩ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් තිස්පන්දාහට (රු. 35,000) සහ රුපියල් තිස්දාහට (රු. 30,000) හෝ ඊට වැඩි ගණන්වලට පිළිවෙලින් ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

(1) ඇඹිලිපිටිය උප කොට්ඨාශයේ කරදි ආර පාලමේ පහළ කොටස තැනීම,
(2) ඇඹිලිපිටිය උප කොට්ඨාශයේ කරදි ආර පාලමේ ඉහළ කොටස තැනීම.

2. ඇඹිලිපිටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරුතැන ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් ෆෝරම්වල ටෙන්ඩර් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුයි. වැඩි විස්තරද එම ඉංජිනේරුතැනගෙන් දැනගත හැක.

3. 1960 ඔක්තෝබර් මස 3 වෙනි දින සිට 5 වෙනි දින දක්වා (දෙදිනම ඇතුළුව සහ අවසාන දින සවස 3 දක්වා පමණක්) කායශීලීය වේලාවල් තුළදී ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ෆෝරම ලබාගැනීම සඳහා ඉහත සඳහන් වැඩ පිළිබඳ අවශ්‍ය තැන්පත් මුදල් (එක ටෙන්ඩරයකට රුපියල් 50 බැගින්) ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය හෝ කුවිතාන්සි ද ලියාපදිංචි කරන ලද පොතද ඉදිරිපත් කළ යුතුයි. දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය එම වැඩ භාර නිලධාරීන් ගෙන් එම වැඩය හෝ වැඩ සතුටුදායක ලෙසට කරගෙන යන බවට සහ දැනට ආණ්ඩුව යටතේ තිබෙන වැඩ ප්‍රමාණය ගැනද සහතික ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සම්පූර්ණයෙන් රජය සතුය.

ඇම්. ජේ. ඇෆ්. ආර්. සේනාරත්න,
ඇඹිලිපිටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග
ඉංජිනේරුතැන.

වාරිමාර්ග කායශීලය,
ඇඹිලිපිටිය,
1960. 8. 29.

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### මින්නේරිය ගොවිජනපදයේ නිවාස ඉදිකිරීම

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරිය ව්‍යාපාරයේ ජනපද නිවාස 455 ක් සහිත ඒකාබද්ධ වැසිකිළි තැනීම සඳහා ටෙන්ඩර් 1960 ඔක්තෝබර් මස 4 වෙනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් කරු විසින් ටෙන්ඩරය භාරගත් දින සිට මාස 12 ක් ඇතුළතදී භාරගත් වැඩය නිම කළ යුතුයි. නිවාස 455 සහිත ඒකාබද්ධ වැසිකිළි සියල්ලටම හෝ එයින් 50 කට අඩු නොවූ කොටසකට පහත දැක්වෙන අයුරින් ටෙන්ඩර් කළ හැක :—

(අ) සීමා රහිත ප්‍රමාණයකට ටෙන්ඩර් කිරීමට හැකි ටෙන්ඩර් කරුවන් සඳහා නිවාස 455 සහිත ඒකාබද්ධ වැසිකිළි.

(ආ) රු. 1,00,000 කට හෝ ඉන් අධික ගණනකට ටෙන්ඩර් කිරීමට හැකි ටෙන්ඩර් කරුවන් සඳහා නිවාස 150 සහිත ඒකාබද්ධ වැසිකිළි.

(ඇ) රු. 50,000 පටන් රු. 1,00,000 දක්වා ටෙන්ඩර් කිරීමට හැකි ටෙන්ඩර් කරුවන් සඳහා—නිවාස 50 සහිත ඒකාබද්ධ වැසිකිළි.

(අ) වර්ගයේ ටෙන්ඩර් කරුවන් සඳහා වරකට නිවාස 150 ක් දෙනු ලැබේ. යම් හෙයකින් ටෙන්ඩර්කරු සතුටුදායක ලෙස නියමිත නිවාස 150 හේ වැඩ කරගෙන යෑම නොපෙන්වුවහොත්, ඊට පසු ඔහුහට නියමිත කොටස් නොදෙනවා පමණක් නොව, කොන්ත්‍රාත්තුව එයින් අවසන් වූ බව සලකනු ලබන්නේ ය. එමෙන් ම, (ආ) වර්ගයේ කොන්ත්‍රාත් කරුවන්ට නිවාස 50 හේ කොටස් ද, (ඇ) වර්ගයේ කොන්ත්‍රාත් කරුවන්ට නිවාස 10 කොටස් වශයෙන්ද ඉහතකී ආකාරයට දෙනු ලැබේ.

2. ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්ම දෙකක ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂතැනගෙන් ඉල්ලුම් කට යුතුයි.

3. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රු. 50,000 කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1960 සැප්තැම්බර් මස 28 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුවේ හෝ ලංකා බැංකුවේ කොළඹ ශාඛාවේ ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තැනගේ අංක 1 දරණ ගණනයට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

සී. ද ෆ්‍රොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ.

1960 සැප්තැම්බර් මස
කොළඹ 1, එච්ලන් චතුරශ්‍රයේ
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### කවුඩුල්ල ව්‍යාපාරයේ ජනපද නිවාස සහිත ඒකාබඩ වැසිකිළි සෑදීම

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා විසින් පොළොන්නරුවේ කවුඩුල්ල ව්‍යාපාරයේ ජනපද නිවාස 800 ක් සහිත වැසිකිළි සෑදීම සඳහා ටෙන්ඩර් 1960 ඔක්තෝබර් මස 4 වෙනි දින පෙ. ව. 10ය තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය භාරගත් දා සිට මාස 12ක් ඇතුළතදී භාරගත් වැඩය නිම කළ යුතුයි. ටෙන්ඩර් කරුවෙකුට නිවාස 800 සහිත වැසිකිළි සියල්ලටම හෝ එයින් 50කට අඩු නොවූ කොටසකට පහත සඳහන් පරිදි ටෙන්ඩර් කළ හැක :—

(අ) සීමා රහිත ප්‍රමාණයකට ටෙන්ඩර් කිරීමට සුදුසු ටෙන්ඩර් කරුවන් නිවාස 800 සහිත ඒකාබඩ වැසිකිලි.

(ආ) රු. 1,00,000 කට හෝ ඉන් අධික ගණනකට වැඩ භාර ගැනීමට සුදුසු ටෙන්ඩර් කරුවන් සඳහා නිවාස 150 සහිත ඒකාබඩ වැසිකිලි.

(ඇ) රු. 50,000 පටන් රු. 1,00,000 දක්වා ටෙන්ඩර් කිරීමට ටෙන්ඩර් කරුවන් සඳහා නිවාස 50 සහිත ඒකාබඩ වැසිකිලි.

(අ) වර්ගයේ ටෙන්ඩර් කරුවන් සඳහා වරකට නිවාස 150 ක් දෙනු ලැබේ. යම්හෙයකින් ටෙන්ඩර්කරු සතුටුදායක ලෙස නියමිත නිවාස 150හේ වැඩ කරගෙන යෑම නොපෙන්වුවහොත්, ඊට පසු නියමිත කොටස් නොදෙනවා පමණක් නොව, කොන්ත්‍රාත්තුව එයින් අවසන් වූ බැව් සලකනු ලබන්නේ ය. (ආ) වර්ගයේ කොන්ත්‍රාත් කරුවන්ට නිවාස 50හේ කොටස් ද (ඇ) වර්ගයේ අයට නිවාස 10 කොටස් වශයෙන් ද ඉහත කී ආකාරයට දෙනු ලැබේ.

2. ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්ම දෙකක ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුයි. වැඩි විස්තර එකී අධ්‍යක්‍ෂ තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.

3. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිඞ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රු. 50,000 කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1960 සැප්තැම්බර් මස 28 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ ලංකා බැංකුවේ කොළඹ ශාඛාවේ ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තැනගේ අංක 1 දරණ ගණනයට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 100 තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

සී. ද ෆ්‍රොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ.

1960 සැප්තැම්බර් මස
කොළඹ 1, එච්ලන් චතුරශ්‍රයේ
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීය.

---

කොළඹ ඇච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 සැප්තැම්බර මස 19 වන ද පෙරවරු 10 තෙක් "ස්වේෂන් වැගනයක්" සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තුමාගෙන් ලබා ගන්නා ලද පෝර්ම පත්‍රවල (අනු පිටපතකුත් සහිතව) ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තුමාගෙන් දැන ගත හැක.

1960 සැප්තැම්බර මස 16 වන දා දහවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තුමා නමට ලංකා බැංකුවේ නාගරික ශාඛාවේ (මුදල් තැන්පත් කිරීම—1) යටතේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රුපියල් 50ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඇස්. නමසිවායම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1. 1960 සැප්තැම්බර 3 වැනි දින.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළුවැව ව්‍යාපාරයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් රජයේ ලී මෝලේ පිටපලු අලෙවිකිරීම

දඹුල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරිතැන විසින් ඉහත සඳහන් ලී මෝලේ දැව පිටපලු ඝන යාර 1,500ක් පමණ අලෙවි කිරීම සඳහා වර්‍ෂ 1960ක්වූ සැප්තැම්බර් මස 27 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. මෙකී පිටපලු හුරුළුවැවේ ලී මෝලේ වැඩ කරන වේලාව ඇතුළතදී බැලිය හැක.

නියමිත ටෙන්ඩර් පත්‍ර දඹුල්ල ඉඩම් සංවර්ධන නිලධාරි තුමාගේ කාර්යාලයෙන් 1960 සැප්තැම්බර් මස 20 වෙනි අඟහරුවාදා පස්වරු 3 දක්වා නිකුත් කරනු ලැබේ. ඒ සඳහා කච්චේරියක හෝ මෙම කන්තෝරුවෙහි රු. 50ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ඉදිරිපත් කළ යුතුයි.

ටෙන්ඩර් පත්‍ර 1960 සැප්තැම්බර් මස 27 වෙනි දින පස්වරු 3ට දඹුල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරිතුමාගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී සතුටු නම් ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ට පෙනී සිටිය හැක.

මේ සම්බන්ධ සම්පූර්ණ විස්තර දඹුල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඉඩම් සංවර්ධන නිලධාරි තැන.
දඹුල්ල.

ඉඩම් සංවර්ධන කාර්යාලය,
දඹුල්ල, 27.8.60.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

1. **ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1960 ඔක්තෝබර් මස 1 වෙනිද සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට, දුම්රිය ස්ථානවල/සෞඛ්‍ය කාර්යාලවල/ආණ්ඩුවේ ගොවිපලවල/සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර, කොළඹ, ගාලු මුවදොර, මහාලේකම් කාර්යාලය යාබද ''බී'' අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන ඡේදයෙහි සඳහන් පරිදි, රු. 100ක තැන්පත් මුදලක්, මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

**සැ. යු.**—කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝරම මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට හන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නො දරණ අය ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,''බී'' අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කාර්යාලයය, ගාලු මුවදොර, කොළඹ'', කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
මුදල් අංශය, ගාලු මුවදොර,
මහලේකම් කාර්යාලය,
කොළඹ, 5.9.60.

### උපලේඛනය

| | (1) සේවය | (2) ප්‍රදේශය | (3) යැවිය හැකි ප්‍රමාණය | (4) අවසාන දිනය |
|---|---|---|---|---|
| | **මහනුවර කොට්ඨාශය** | | | |
| 1. | කටුගස්තොට දුම්රියපොළේ සිට ගලගෙදර සෞඛ්‍ය කාර්යාලයට සහ ගලගෙදර සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ගලගෙදර | ... 5,100 | 30.9.60 |
| | **කුරුණෑගල කොට්ඨාශය** | | | |
| 2. | පොල්ගහවෙල දුම්රියපොළේ සිට පොල්ගහවෙල සෞඛ්‍ය කාර්යාලයට සහ පොල්ගහවෙල සෞඛ්‍ය කාර්යාලයේ සිට පොල්ගහවෙල සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | පොල්ගහවෙල | ... 10,850 | |
| | **පුත්තලම් කොට්ඨාශය** | | | |
| 3. | මාරවිල සෞඛ්‍ය කාර්යාලයේ සිට මාරවිල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මාරවිල (නාත්තන්ඩිය) | ... 9,300 | |
| | **වවුනියා කොට්ඨාශය** | | | |
| 4. | මාන්කුලම් දුම්රියපොළේ සිට මුලතිව් සෞඛ්‍ය කාර්යාලයට සහ මුලතිව් සෞඛ්‍ය කාර්යාලයේ සිට මුලතිව් සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මුලතිව් | ... 6,750 | |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 සැප්තැම්බර් 27 වැනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

(1) බදුල්ල ආරෝග්‍ය ශාලාවේ ළිං අළුත්වැඩියා කිරීම හා ස්ටෝරු කාමරයක් තැනීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 සැප්තැම්බර් 23 වැනි සිකුරාද සවස 4 වන තෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 5,000කට වඩා වටිනාකමැති ගොඩනැගිලි කර්මාන්ත යන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරිංටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7,
දිනය : 31.8.60.

---

## නියෝජ්‍ය ආහාර පාලක තුමාගේ සැපයීමේ මධ්‍යස්ථානවල සිට ප්‍රදේශයේ පාසල්වලට බනිස් සපයන බේකරි හිමියන් වෙත ඇඳිහැස පිටි ගෙනයාම

මහනුවර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ඉහත සඳහන් සේවය සඳහා සීල් තබන ලද පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර 1960 සැප්තැම්බර් 23 වන සිකුරාදා සවස 2 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් කරුවන් මේ සඳහා නියමිත ටෙන්ඩර පෝර්ම මහනුවර අධ්‍යාපන කාර්යාලයයෙන් ලබාගෙන පහත දැක්වෙන එක් එක් සැපයීමේ මධ්‍යස්ථානයන් වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් කරුවන් මේ සේවය සඳහා ටෙන්ඩර් පිළියෙල කිරීමේදී රා. 50හේ පිටි මිටියක් සැතපුමක් දුර ගෙනයාමට අය කරනු ලබන ගාස්තුවද, දුර ප්‍රමාණය ගැන නොසලකා එම ප්‍රමාණයේම පිටි මිටියක් ගෙනයාම සඳහා අය කරනු ලබන මධ්‍යස්ථ ගාස්තුවද වෙන වෙනම දැක්විය යුතුයි. තෝරාගනු ලබන ටෙන්ඩර් කරුවන් විසින් කළ යුතුව ඇත්තේ සැපයීමේ ස්ථානවල සිට පිටි ගෙන ගොස් බලය ලත් බේකරි හිමියන් වෙත බාර දීමයි. සාමාන්‍ය යෙන් පාසල් වාරයකට දෙවරක් බැගින් බනිස් සපයන්නන් වෙත පිටි ගෙන යා යුතුයි. පිටි නිකුත් කිරීමේ බලපත්‍ර ලැබී දින තුනක් ඇතුළතදී බනිස් සපයන්නන් වෙත පිටි ගෙන යා යුතුයි.

3. 1960 සැප්තැම්බර් 22 වන බ්‍රහස්පතින්දා සවස 4.30 වන තුරු ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. භාරගන්නා ලද ටෙන්ඩර් පත්‍ර 1960 සැප්තැම්බර් 23 වන සිකුරාදා සවස 3ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණීමට අවසර දෙනු ලැබේ.

4. ටෙන්ඩර් පත්‍රයක සඳහන් ගාස්තු ක්‍රම දෙක (එනම්, මධ්‍යස්ථ ගාස්තු ක්‍රමය හා සැතපුමකට අය කරනු ලබන ගාස්තු ක්‍රමය) අතුරින් එකක් භාරගැනුම හෝ ටෙන්ඩර් පත්‍රයක සඳහන් කොටසක් ප්‍රතික්ෂෙප කිරීම පිළිබඳ අයිතිය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත පැවරෙනු ඇත.

5. ටෙන්ඩර් පත්‍ර අවසාන වශයෙන් භාරගන්නා ලද දින සිට සති හයක් ගතවන තුරු වලංගුව තැබිය යුතුයි.

6. මේ පිළිබඳව හා කොන්ත්‍රාත්තුව පිළිබඳව තවදුරටත් විස්තර ආදිය සතියේ වැඩ කරන දිනයක රාජකාර්‍ය කාලය තුළදී මහනුවර අධ්‍යාපන කාර්යාලයට පැමිණීමෙන් ලබාගත හැක.

#### සැපයීමේ මධ්‍යස්ථාන

| | |
|---|---|
| මහනුවර | කඩුගන්නාව |
| කුන්ඩසාලේ | නාවලපිටිය |
| ගම්පොල | නුවරඑළිය |
| කටුගස්තොට | රාගල |
| වත්තේගම | හැටන් |
| මාතලේ | තලවකැලේ |

ජී. එච්. බී. ඒකනායක
මහනුවර අධ්‍යාපන නිලධාරි තැන.

60.9.2 වන දින,
මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දීය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

1961කේ අවුරුද්ද තුළ පැට්රල් සහ ඔටො මොබිල් ගැස් තෙල් සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර නාරාහේන්පිට කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960වේ ඔක්තෝබර් මස 26 වෙනි දා වන බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර නියමිත පෝරම කොලවල ලියා අනුපිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. ඒ පෝරම කොළ බොරලැස්ගමුවේ වේරහැර පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක කාර්යාලයෙන් 1960 ඔක්තෝබර් මස [illegible] වෙනි අඟහරුවාදා දවල් දොලහ වනතුරු ලබාගත හැකිය. ඒවා ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි කාර්යාලයෙහි රුපියල් 50ක ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඊට ලැබුණු කුවිතාන්සිය ඉදිරිපත් කල විටය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් වැඩි විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම්තැන.

1960. 9. 9.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

වාතේ රාක්ක සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960වේ නොවැම්බර් මස 9 වෙනිදා වන බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර නියමිත පෝරම කොළවල ලියා අනුපිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. ඒ පෝරම කොළ බොරලැස්ගමුවේ වේරහැර පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක කාර්යාලයෙන් 1960වේ නොවැම්බර් මස 8 වෙනි දා වන අඟහරුවාද දවල් 12 වන තුරු ලබාගත හැකිය. ඒවා ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි කාර්යාලයෙහි රු. 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කොට ඊට ලැබුණු කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් වැඩි විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම්තැන.

1960. 9. 9 වෙනි දිනදීය.

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### ස්ටැන්ලි සහ ලක්ෂපාන විදුලිබල ස්ථානයන්හි පාලන කාමරවලට වායුසමන යන්ත්‍ර සැපයීම සහ පිහිටුවීම

1. ඉහත සඳහන් බඩු සැපයීම සහ පිහිටුවීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1960 ක් වූ නොවැම්බර් මස 1 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් බාරගනු ලැබේ.

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 සැප්තැම්බර් මස 22 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට ඇඹරුම් යන්ත්‍රයක්, ඩී. සී. මෝටරයක්, "ඉන්ඩක්ෂන්" මෝටර් 2ක් සහ "ඕල්ටර්නේටර්" යන්ත්‍රයක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 සැප්තැම්බර් මස 22 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවනු අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්‍ෂා කළ හැක. රු. 25ක මුදලක් වරාය කොමිෂන් කායසීලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොලවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 සැප්තැම්බර් මස 21 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය සඳහා ඇපකරුවන් අවශ්‍ය වී නම් එය සැපයීමට ටෙන්ඩර් කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60 ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරායේ කොමසාරිස්.

1960 අගෝස්තු මස 31 වෙනි දින,
කොළඹ, වරාය කොමිෂන් සභා කාර්යාලයේදීය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ සිට බිලුමැන්ඩල් හි පිහිටි දෙපාර්ත මේන්තුවේ කුණු පිට්ටනිය වෙත අලාභ හානිවූ නැව් බඩු වෂී 1960 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට වෂීයක් ප්‍රවාහණය සඳහා ලොරි සැපයීම පිණිසවූ ටෙන්ඩර්, 1960 සැප්තැම්බර් මස 22 වන බ්‍රහස් පතින්දා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් භාරගනු ලැබේ.

ප්‍රධාන ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබා ගතහැකි ටෙන්ඩර් පෝර්මවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. කොළඹ වරාය කොමිෂන් සභාවේ සරප් තැන වෙත රු. 50 ක මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කල විට 1960 සැප්තැම්බර් මස 21 වෙනි බදාදා දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරාය කොමසාරිස්.

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 සැප්තැම්බර් මස 22 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට යාත්‍රාවල පිටතින් සවිකරන "අවුට්බෝඩ්" මෝටරයක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 සැප්තැම්බර් මස 22 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 25 මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොලවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 සැප්තැම්බර් මස 21 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරායේ කොමසාරිස්.

1960 සැප්තැම්බර් මස 3 වෙනි දින,
කොළඹ, වරාය කොමිෂන් කාර්යාලයේදීය.

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 සැප්තැම්බර් මස 22 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා, පාවිච්චිකළ නොහැකි මෝටර් රථයක්, ගිලන් රථයක් සහ තෙල් රථයක් විකිනීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1960 සැප්තැම්බර් මස 22 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ බවට එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගතයුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපිලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්‍ෂා කළ හැක. රු. 50ක මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොල ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇපමුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොල වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 සැප්තැම්බර් මස 21 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර් කරු විසින් පාවිච්චිකළ නොහැකි බඩු වරාය කොමිෂන් සීමා වෙන් ඉවත් කිරීමට ප්‍රථමයෙන් රේගුවේ දෙපාර්තමේන්තුවට අය විය යුතු තීරු බද්ද ගෙවිය යුතුය.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරායේ කොමසාරිස්.

1960 සැප්තැම්බර් මස 1 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදීය.

---

මගේ අංකය : අයි/පීකේඇස්/522/2

## පුත්තලම් කච්චේරිය

### පුත්තලම් දිස්ත්‍රික්කයේ සුළු වාරිකර්ම වැඩ

පහත දක්වන වාරිකර්ම වැඩය සඳහා මෙම කච්චේරියෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍ර වල එවන ගණන් යෝජනා පත්‍ර 1960 සැප්තැම්බර් මස 13 වැනි දින පෙ. ව. 10 දක්වා භාර ගනු ලැබේ.

1. කුම්බුවන රෙගුලේටර්.

වැඩය වෙනුවෙන් රුපියල් දහයක මුදලක් තැන්පත් කිරීමෙන් 1960 සැප්තැම්බර් මස 12 වැනි දින පස්වරු 3 වන තුරු ගණන් යෝජනා ආකෘති පත්‍ර ලබා ගත හැක. සමුපකාර ආයතන සහ ග්‍රාම සංවර්ධන සමිති ගණන් යෝජනා ආකෘති පත්‍ර ලබා ගැනීමේදී මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නොවේ.

ගණන් යෝජනා පත්‍ර විවෘත කිරීම 1960 සැප්තැම්බර් මස 13 වැනි දින පෙ. ව. 10 ට පටන් ගන්නවා ඇත. ඒ වේලාවට ඉල්ලුම් කරුවනටද පෙනී සිටීමට අවසර තිබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුද්ගලිකව හෝ ලියවිල්ලකින් හෝ විමසීමෙන් මගෙන් ලබාගත හැක.

වී. කේ. රාජරත්නම්,
පුත්තලමේ දිසාපති තුමා වෙනුවට.

1960 සැප්තැම්බර් මස 2 දින,
පුත්තලම් කච්චේරියේ දීය.

---

## රත්නපුර කච්චේරිය

### රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ කලුවාවලතැන්න ගම් විශාල කිරීමේ යෝජනා ක්‍රමයට ජලය සැපයීම පිණිස ටැංකියක් බැඳීම සහ ඊට අවශ්‍ය ජල නල සවිකිරීම

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ කලුවාවලතැන්න ගම් විශාල කිරීමේ යෝජනා ක්‍රමයට ජලය සැපයීම පිණිස ටැංකියක් බැඳීම සහ ඊට අවශ්‍ය ජල නල සවිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 ඔක්තෝබර් මස 8 වැනි දින පෙරවරු 10 තෙක් රජයේ දෙපාර්ත මේන්තුවල ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතැන විසින් භාරගනු ලැබේ.

1960 ඔක්තෝබර් මස 7 වැනි දින පෙරවරු 10 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලබන්නේ රත්නපුර කච්චේරියේ රුපියල් විසි පහක් (රු. 25) තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කලාට පසුවය.

ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එසේ නැත්නම් කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර ඔවුන් අතින්ම හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ අතින් හෝ පහත නම් සඳහන් අයට භාර දිය හැක.

ටෙන්ඩර් පත්‍ර සීල් තබා පිට කවරයේ වම් කෙළවරේ "කලුවාවල තැන්න ගොවි ජනපදයට ජලය සැපයීමේ යෝජනා ක්‍රමය" යන්න සඳහන් කළ යුතුයි. එසේම පිට කවරයේ තමන්ගේ නම සහ ලිපිනයද සඳහන් කිරීම වැදගත් වේ.

වැඩය සඳහා ඉල්ලුම් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රවල දෙවැනි පිටපත පරීක්ෂාකර බැලීම අවශ්‍ය යයි හැඟෙතොත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගෙන් ඒ සඳහා අවශ්‍ය විධි විධාන සලස්වා ගත හැක.

ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ගැන සලකා බැලීම පිණිස 1960 ඔක්තෝබර් මස 8 වැනි දින පෙරවරු 10ට කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපිටදී ඒවා විවෘත කරණු ලබන හෙයින්, ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන් සියලුදෙනාම එදින නියමිත වේලාවට මෙම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතුයි.

ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට පළමු තමා ඉල්ලුම් කරන වැඩය ගැන සියලු විස්තර තමාම පරීක්ෂාකර බලාගත් බැව් ඉල්ලීම ගැන සලකා බැලීමේදී හඟිනු ලැබේ.
වැඩි විස්තර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. ඩී. ධම්සේන,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1960 අගෝස්තු මස 29 වැනි දින,
රත්නපුර කච්චේරියේ දීය.

---

## රත්නපුර කච්චේරිය

**රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ කලුවාවලතැන්න ගම් විශාල කිරීමේ යෝජනා ක්‍රමයට ජලය ලබා දීම පිණිස ජල නල සැපයීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ කලුවාවලතැන්න ගම් විශාල කිරීමේ යෝජනා ක්‍රමයට ජලය ලබාදීම පිණිස ජල නල සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 ඔක්තෝබර් මස 8 වැනි දින පෙරවරු 10 තෙක් රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් භාරගනු ලැබේ.

1960 ඔක්තෝබර් මස 7 වැනි දින පෙරවරු 10 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලබන්නේ රත්නපුර කච්චේරියේ රුපියල් විසි පහක් (රු. 25) තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළාට පසුවය.

ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එසේ නැත්නම් කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර ඔවුන් අතින්ම හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ අතින් හෝ පහත නම් සඳහන් අයට භාර දිය හැක.

ටෙන්ඩර් පත්‍ර සීල් තබා පිට කවරයේ වම් කෙළවරේ "කලුවාවල තැන්න ගොවි ජනපදයට ජලය සැපයීමේ යෝජනා ක්‍රමය" යන්න සඳහන් කළ යුතුයි. එසේම පිට කවරයේ තමන්ගේ නම සහ ලිපිනයද සඳහන් කිරීම වැදගත් වේ.

වැඩය සඳහා ඉල්ලුම් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රවල දෙවැනි පිටපත පරීක්ෂාකර බැලීමට අවශ්‍ය යයි හැඟෙතොත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගෙන් ඒ සඳහා අවශ්‍ය විධි විධාන සලස්වා ගත හැක.

ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ගැන සලකා බැලීම පිණිස 1960 ඔක්තෝබර් මස 8 වැනි දින පෙරවරු 10ට කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපිටදී ඒවා විවෘත කරණු ලබන හෙයින්, ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන් සියලුදෙනාම එදින නියමිත වේලාවට මෙම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතුයි.

ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට පළමු තමා ඉල්ලුම් කරන වැඩය ගැන සියලු විස්තර තමාම පරීක්ෂාකර බලාගත් බැව් ඉල්ලීම ගැන සලකා බැලීමේදී හඟිනු ලැබේ.
වැඩි විස්තර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. ඩී. ධම්සේන,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1960 අගෝස්තු මස 29 වැනි දින,
රත්නපුර කච්චේරියේ දීය.

---

## මොණරාගල දිස්ත්‍රික්කයේ වැව්ලි ද්‍රව්‍ය ගෙන යාම

මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති පරිදි වැව්ලි ද්‍රව්‍ය ගෙන යාමේ ටැන්ඩර් මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් 1960 සැප්තැම්බර් මස 23 වැනි දින දවල් 12 වන තෙක් භාරගනු ලැබේ.

දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ රුපියල් 25 ක මුදලක් තැන්පත්කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මොණරාගල දිසාපති තුමා විසින් 1960 සැප්තැම්බර් මස 21 වැනි දින පස්වරු 3 තෙක් ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් එවිය යුත්තේ කච්චේරියෙන් ලබාගත් නියමිත ටැන්ඩර් පෝරම වලය.

සියළුම ටැන්ඩර් සීල් කරන ලද ලියුම් කවරයක විය යුතුය. ලියුම් කවරයේ "**වැව්ලි ද්‍රව්‍ය ගෙනයාමේ ටැන්ඩර්**" යයි සඳහන් කර මොණරාගල දිසාපති තුමාට එවිය යුතුය. ටැන්ඩර් එවිය යුත්තේ ලියා පදිංචි කරන ලද තැපෑලෙන් ය. එසේ නැතිනම් මෙම කච්චේරියේ කාර්යාල සහකාර මහතා ළඟ ඇති ටැන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

**කොන්දේසි :—**

(1) ඕනෑම ටැන්ඩරයක් හෝ එයින් කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සම්පූර්ණයෙන්ම දිසාපති තුමාට පැවරේ.
(2) එක් එක් වැව්ලි ද්‍රව්‍ය තිබෙන ස්ථාන වලින් ඒවා බෙදා හැරීමේ ඕනෑම මධ්‍යස්ථානයකට ගෙනයා යුතු ප්‍රමාණය දිසාපතිතුමා විසින් සීමා කරනු ලැබේ.
(3) වැව්ලි ද්‍රව්‍ය තිබෙන ස්ථානවලින් බෙදා හැරීමේ මධ්‍යස්ථාන වලට ගෙන යාමේ කාල සීමාව සහ ගෙනයා යුතු ප්‍රමාණය වරින් වර දිසාපති තුමා විසින් තීරණය කරනු ලැබේ.
(4) දිසාපති තුමා හෝ ඔහුගෙන් බලය ලත් නිලධාරි තැන පිළිගත් ටැන්ඩර්කරුට 24 පැයක දැන්වීමකින් පසුව වැව්ලි ද්‍රව්‍ය තිබෙන ස්ථානයේ සිට ගෙනයායුතු ස්ථානයට ගෙනයාමට නියෝග කරනු ඇත.
(5) වැව්ලි ද්‍රව්‍ය ගෙනයාමට මිල ගණන් ටැන්ඩරයේ සඳහන් කරන විට එම ගණන ට වැව්ලි ද්‍රව්‍ය පැටවීමේ සහ බෑමේ ගාස්තු වද ඇතුළත් විය යුතුය.
(6) දිසාපති තුමා විසින් පත් කරන ලද නිලධාරි තැනගේ උප දෙස් අනුව වැව්ලි ද්‍රව්‍ය පැටවීම හෝ බෑම කළ යුතුය.
(7) පිළිගත් ටැන්ඩර් කරු විසින් වැව්ලි ද්‍රව්‍ය ගෙනයාමේදී ඒවායේ ආරක්ෂාව ගැන වග කිය යුතුය.

උපලේඛනයේ සඳහන් එක් එක් වැව්ලි ද්‍රව්‍ය වර්ග ගෙන යාමට ටැන්ඩර් වෙන වෙනම එවිය යුතුය. එක් එක් වැව්ලි ද්‍රව්‍ය වර්ග සඳහා ටැන්ඩර් ලබා ගැනීමට තැන්පත් කිරීමේ ගාස්තුව වෙන වෙනම තැන්පත් කළ යුතුය.

ටැන්ඩර්කරුවන් විසින් ටැන්ඩර් එවන විට ඔවුන් සතු වාහන වල ලියාපදිංචි කරන ලද අංක සඳහන් කළ යුතුය.

### උපලේඛනය

| වැව්ලි ද්‍රව්‍යයේ නම | ලබාදෙන ස්ථාන | ගෙනයායුතු ස්ථාන |
|---|---|---|
| 1. පොල්පැල ... | 1. ගාලු දිස්ත්‍රික්කයේ කොග්ගල | 1. ඇටිමොලේ ජනපදය |
| | 2. හම්බන්තොට දිස්ත්‍රික්කයේ දෙමටවිල | 2. මාගන්දනඔය ජනපදය |
| | 3. මඩකලපු දිස්ත්‍රික්කයේ මයිලන්භාවෙලි | 3. හුලන්දව ජනපදය |
| | 4. කුරුණෑගල දිස්ත්‍රික්කයේ බතලගොඩ | 4. නක්කල ජනපදය |
| | 5. හඳපාන්ගල-වැල්ලවාය | 5. තෙලුල්ල ව්‍යාපාරය |
| | 6. නක්කල-මොණරාගල | 6. උඩගම ව්‍යාපාරය |
| | | 7. ඔක්කම්පිටිය ජනපදය |
| | | 8. මඩුගහපට්ටිය ව්‍යාපාරය |
| | | 9. අතලේ ව්‍යාපාරය |
| | | 10. බෝගහපැලැස්ස ව්‍යාපාරය |
| | | 11. යාකුරාව ව්‍යාපාරය |
| 2. කෙහෙල් පැල | 1. වෙහෙරයාය ජනපදය | 1. ඇටිමොලේ සහ මාගන්දන ඔය ජනපද |
| | 2. හඳපාන්ගල ජනපදය | |
| 3. දෙහි පැල ... | 1. බිබිලේ කෘෂිකර්ම මධ්‍යස්ථානය | 1. ඇටිමෝලේ සහ මාගන්දන ඔය ජනපද |
| 4. දෙඩම් පැල ... | 1. බිබිලේ කෘෂිකර්ම මධ්‍යස්ථානය | 1. ඇටිමොලේ ජනපදය |
| | | 2. නක්කල ජනපදය |
| | | 3. තෙලුල්ල ව්‍යාපාරය |
| 5. ක්ලෝනල් රබර් පැල | 1. කළුතර දිස්ත්‍රික්කයේ ඇගල් ඔය තවාන | 1. කටුගහගල්ගේ ජනපදය |
| | | 2. මඩුගහපට්ටිය ව්‍යාපාරය |

පිළිගත් ටැන්ඩර්කරු විසින් පහත සඳහන් වැව්ලි ද්‍රව්‍ය ප්‍රමාණයන් දළ වශයෙන් ගෙනයාමට නියම කරනු ඇත.

| | |
|---|---|
| පොල් පැල ... ... | 1,32,500 |
| කෙහෙල් පැල ... ... | 1,96,000 |
| දෙහි පැල ... ... | 65,000 |
| දෙඩම් පැල ... ... | 5,000 |
| ක්ලෝනල් රබර් පැල... ... | 2,000 |

වී. පී. සිල්වා,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙනුවට.

1960 සැප්තැම්බර් මස 2 වෙනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේදීය.

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

යටියන්තොට ජල යෝජනා ක්‍රමය සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහනය සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 නොවැම්බර් මස 2 වෙනි බදාදා පෙරවරු 11.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්මලානේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ජල වැඩ පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 සැප්තැම්බර් මස 30 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ "ඒ" "බී" සහ "සී" කොටස්වල ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

6. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන විට මේ හා සමාන වැඩ පිළිබඳ දැනීම හා ඒ වැඩ සඳහා සුදුසු නිලධාරීන් සිටින බවට සාක්ෂි ඉදිරිපත් කළයුතුයි.

සී. රාසයියා,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ
වෙනුවට.

1960 අගෝස්තු මස 30 වෙනි දින,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

හලාවත දිස්ත්‍රික්කයේ ජනපද ව්‍යාපාර ගොඩනැගිලිවල විශේෂ අළුත් වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 සැප්තැම්බර් මස 28 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. හලාවත ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 සැප්තැම්බර් මස 16 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 11,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති . සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේදීය, 1960. 9. 5.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

බදුල්ලේ අධිකාරී ඉංජිනේරු තැනගේ බංගලාවේ සහ කාර්යාලයේ ජලධාරා ක්‍රමයක් ඇතිකිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 සැප්තැම්බර් මස 28 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. බදුල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 සැප්තැම්බර් මස 16 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ කාණු ක්‍රම වැඩ සඳහා රුපියල් 10,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර කොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති., සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේදීය, 1960. 9. 5.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

හිනිදුම රෝහලේ විදුලි බල මධ්‍යස්ථානය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 සැප්තැම්බර් මස 28 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. ගාල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 සැප්තැම්බර් මස 16 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960. 9. 5.

---

රම්බොඩ රෝහලේ පරිපාලන ගොඩනැගිල්ලට සහ ඇපොතිකරි නිවාසයට විශේෂ අළුත් වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 28 වෙන බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. දිඹුල (පතන) ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 සැප්තැම්බර් මස 16 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 6,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා 'නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960. 9. 5.

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## රාජකීය ලංකා නාවික හමුදාව

**1960 අගෝස්තු මාසයෙහිදී ටෙන්ඩර් සම්බන්ධයෙන් ගන්නා ලද අවසාන තීරණය**

| සේවයේ ස්වභාවය | ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ගාස්තු ප්‍රමාණය රු. ශ. | සම්මතවූ ටෙන්ඩර්කරුගේ නම |
|---|---|---|---|
| නාවික හමුදාවට අයත් ලෝන්ච් යාත්‍රා, යාත්‍රාංගනයට ගැනීම සහ ශුද්ධ කිරීම | 1. සීමාසහිත වෝකර් පුත්‍ර මහත්වරුන් සහ සමාගම | 12 50 | ... සීමාසහිත බෝනාස් මහත්වරුන් (ලංකාව) |
| | | 10 0 | |
| | 2. සීමාසහිත බෝනාස් මහත්වරුන් (ලංකාව) | 25 0 | |
| | | 35 0 | |
| | | 12 50 | |
| | | 12 50 | |
| | | 10 0 | |
| | | 25 0 | |
| | | 35 0 | |
| | | 15 0 | |
| | | 10 0 | |
| | | 25 0 | |
| | | 40 0 | |
| | | 15 0 | |
| | | 15 0 | |
| | | 10 0 | |
| | | 25 0 | |
| | | 40 0 | |
| | | 15 0 | |
| | | 20 0 | |
| | | 15 0 | |
| | | 25 0 | |
| | | 45 0 | |
| | | 17 50 | |

ජී. ආර්. ඇම්. ද මැල්,
රියර් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

මූලස්ථානය,
රාජකීය ලංකා නාවික හමුදාව,
තැ. පෙ. 593,
කොළඹ, 60.8.31.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මධ්‍යම කොට්ඨාශ බද හසලක උප කොට්ඨාශයේදී 1960 මාර්තු මාසය තුළ තීන්දු කළ ටෙන්ඩර්

| සේවය | ටෙන්ඩර්කරුවන්ගේ නම | භාරගත් ගණන රු. ශ. | තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුගේ නම |
|---|---|---|---|
| අංක 65 දරණ නිවුන් කම්කරු නිවාසය ඉදිකිරීම ... | ඊ. බී. මීකොටුව, ඇබිලිමීගම, පිළිමතලාව ... | 13,500 25 ... | ඊ. බී. මීකොටුව, ඇබිලිමීගම, පිළිමතලාව |

ඩී. ඩී. වට්මෝර්,
වාරිමාර්ග ඉංජිනේරුතැන,
හසලක උ. කො.

---

## මාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මධ්‍යම කොට්ඨාශබද හසලක උප කොට්ඨාශයේදී 1960 ජූනි මාසය තුළ තීන්දු කළ ටෙන්ඩර්

| සේවය | ටෙන්ඩර්කරුවන්ගේ නම | භාරගත් ගණන රු. ශ. | තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුගේ නම |
|---|---|---|---|
| 1. හසලක වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ ස්ථිර බංගලාව ඉදිකිරීම | ඩී. රොබෝසිඤ්ඤෝ අස්ගිරිය, ගම්පහ ... | 37,857 50 ... | ඩී. රොබෝසිඤ්ඤෝ, අස්ගිරිය, ගම්පහ |
| 2. අංක 19 දරණ අර්ධ ස්ථිර ගබඩාව ඉදිකිරීම ... | ඊ. බී. මීකොටුව, ඇබිලිමීගම, පිළිමතලාව ... | 13,204 50 ... | ඊ. බී. මීකොටුව, ඇබිලිමීගම පිළිමතලාව |

ඩී. ඩී. වට්මෝර්,
වාරිමාර්ග ඉංජිනේතැන,
හසලක උ. කො.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**මොණරාගල උප කොට්ඨාශයේ ඇතිමෝල වැව ව්‍යාපාරයේ බිඳුම් කඩ පිරවීම**

පහත සඳහන් අයගෙන් ටෙන්ඩර් පත්‍ර ලැබුණි :—

1. ඒ. සමරවීර මහත්මයා, වේමුල්ල වත්ත, වැලිමඩ.
2. ඇස්. එච්. ජයතිලක මහත්මයා, ගොඩනැගිලි කොන්ත්‍රාත්කරු, 857, පේරාදෙණිය පාර, නුවර.
3. ඩබ්ලිව්. ඩී. ඇම්. අබේසේකර මහත්මයා, 22, වොරිංටන් මාවත, කොළඹ 7.
4. සිටි කොන්ස්ට්‍රක්ෂනල් වර්ක්ස්, මරදාන පාර, කොළඹ 10.

ප්‍රතිඵල : ඒ. සමරවීර මහත්මයාගේ රු. 94,027.50හේ ටෙන්ඩර් පත්‍රය පිළිගන්නා ලදී.

ඩී. ජේ. රාමණායක,
උ. ප්‍රා. වා. ඉ.

වර්ෂ 1960ක් වූ අගෝස්තු මස 14 දා,
බංඩාරවෙල දීය.

---

## ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු මස පිළිගන්නා ලද ටෙන්ඩර් ප්‍රතිඵල පිළිබඳ විස්තර

| අංකය | වැඩ විස්තරය | ටෙන්ඩර්කරුවන්ගේ නම | අඩුම ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් අඩුම ටෙන්ඩර් කරුගේ ගණන රු. ශ. | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 1 ... | ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ කාර්යාලය සෑදීම | 1. විල්මට් සහ විලියම් සමාගම<br>2. එස්. ටී. එස්. අහමඩ් | 1. විල්මට් සහ විලියම් සමාගම | 33,785 0 ... | — |

ම. ඒ. බලොක්,
ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1960 ජූලි මස ටෙන්ඩර් පිළිබඳ ඇති කරගත් තීරණ**

| සේවය | | ටෙන්ඩර්කරුගේ නම | සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් හා පිළිගත් ගාස්තු | |
|---|---|---|---|---|
| 1. අඩි 7ක් දිග අඟල් 32ක් පළල බී. ඩබ්ලිව්. ජී. 24 පිලි ඇලුමිනියම් තහඩු | 2,000 | සීමාසහිත රිචඩ් පීරිස් සහ සමාගම | 1. සීමාසහිත මැක්වුඩ්ස් සහ සමාගම | රේගු ගාස්තුව රහිතව රු. 18,620 |
| 2. අඩි 8ක් දිග අඟල් 32ක් පළල බී. ඩබ්ලිව්. ජී. 24 පිලි ඇලුමිනියම් තහඩු | 1,000 | සෙන්ට් ඇන්තනි හාඩ්වෙයාර්ස් ස්ටෝර්ස් සහ සමාගම ... | 2. එම | රේගු ගාස්තුව රහිතව රු. 10,640 |
| 3. අඩි 10ක් දිග අඟල් 32ක් පළල බී. ඩබ්ලිව්. ජී. 24 පිලි ඇලුමිනියම් තහඩු | 1,500 | ඒ. සී. පෝල් මහතා ... සීමාසහිත මැක්වුඩ්ස් සහ සමාගම | 3. එම | රේගු ගාස්තුව රහිතව රු. 19,950 |
| 4. සිදුර චතුරශ්‍රාකාර ¼" විට්වර්ඩ්ස් ත්‍රෙඩ් සහිත ඇලුමිනියම් නට්ස් ග්‍රෝස් | 100 | සීමාසහිත කොළඹ ඒජන්සිස් සහ සමාගම | 4. ඒ. සී. පෝල් මහතා | රේගු ගාස්තුව රහිතව රු. 240 |
| 5. ඇලුමිනියම් ඩයමන්ඩ් වොෂර් ඇස්. ඩබ්ලිව්. ජී.20 වහළ බෝල්ට්ස් සමග යෙදීමට ග්‍රෝස් | 100 | සීමාසහිත මැස්කොන්ස් සහ සමාගම<br>නසාර් ට්‍රේඩින් කොම්පැණිය | 5. සීමාසහිත රිචඩ් පීරිස් සහ සමාගම | තොගයෙන් රු. 432 |
| 6. විට්ප්‍රමාණය ¼" ක්වූ ඇලුමිනියම් බෝල්ට් සහ නට්ස්, චතුරශ්‍රාකාර නට්ස් සහිත ඇලුමිනියම් බෝල්ට්ස්, අඟල් 1¼ දිග ඇති වෘත්තාකාර ෂැන්ක් ත්‍රෙඩ් එකක අඩුම දිග අඟලක් විය යුතුයි. ග්‍රෝස් | 100 | සීමාසහිත සැමුවෙල් පුත්‍රයෝ සහ සමාගම<br>ජැෆ්රි සහෝදරයෝ සහ සමාගම<br>සීමාසහිත වෝකර් ඇන් ග්‍රීග් සහ සමාගම | 6. ඒ. සී. පෝල් මහතා | රේගු ගාස්තුව රහිතව රු. 965 |

ඇස්. නමසිවායම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1960 ජූනි මස ඇතිවූ ටෙන්ඩර් පිළිබඳ තීරණයන්**

| සේවය | ටෙන්ඩර්කරුගේ නම | සාර්ථකවූ ටෙන්ඩර්කරු හා පිළිගත් ගාස්තුව |
|---|---|---|
| වීරපාන–ඕපාත ව්‍යාපාරයේ ජනපද නිවාස 124ක් තැනීම | 1. ඇෆ්ජ්. රත්නායක මහතා, දියගහ, නාවිමන...<br>2. ටී. ඒ. ගුණවර්ධන මහතා, "ගුණ මහල්", පොල්හේන | ඇෆ්ජ්.රත්නායක මහතා—නිවාසයක් රු.2,485·68 බැගින්, නිවාස 124කටම රු.3,08,124·32යි. |

ඇස්. නමසිවායම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1960 අගෝස්තු මාසයේ ටෙන්ඩර් පිළිබඳ ඇතිකරගත් තීරණ**

| සේවය | ටෙන්ඩර්කරුවන්ගේ නම් | ප්‍රතිඵල |
|---|---|---|
| හල්විටිගල—දම්මල පාරේ ගල් දැමීම හා තාර දැමීම ... | ඇෆ්ජ්. රත්නායක මහතා, නාවිමන, මාකර ... | ටෙන්ඩරය ප්‍රතික්ෂේප කරන ලදි. |

ඇස්. නමසිවායම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක වෙනුවට.

---

## අධ්‍යාපන දෙපාර්මේතන්තුව

**තීරණය කළ ටැන්ඩර් පිළිබඳ විස්තර—1960 අප්‍රියෙල්, මැයි සහ අගෝස්තු**

| | වැඩය | ටැන්ඩර්කරුවන්ගේ නම් | පිළිගත් ගණන් රු. ශ. | තෝරාගත් ටැන්ඩර්කරුගේ නම |
|---|---|---|---|---|
| 1. | බ/බිබිල ම.ම.වි. වැඩි දියුණු කිරීම ... | ඩී. ඩබලිව්. පී. ජයසුන්දර මහතා ... | 19,737 00 ... | ඩී. ඩබලිව්. පී. ජයසුන්දර මහතා |
| 2. | බ/හල්දුම්මුල්ල ම.වි. කර්මාන්ත ශාලාව ... | එන්. එම්. නිලමුදීන් මහතා ... | 19,033 00 ... | එන්. එම්. නිලමුදීන් මහතා |
| 3. | බ/ඇටම්පිටිය ම.වි. කර්මාන්ත ශාලාව ... | එන්. එම්. නිලමුදීන් මහතා ... | 20,045 00 ... | එන්. එම්. නිලමුදීන් මහතා |
| 4. | බ/නාගදීප ම.වි. ගොඩනැගිලි ... ... | එන්. එම්. නිලමුදීන් මහතා ... | 15,252 40 ... | එන්. එම්. නිලමුදීන් මහතා |
| 5. | මහ/ගිනිගත්හේන ප්‍රා.ප. අළුත් වැඩියාව ... | ඇඹිලිමීගම සහ සමාගම ... | 28,686 00 ... | ඇඹිලිමීගම සහ සමාගම |
| 6. | නු/දීගලහින්න ම.වි. පාසල් ගොඩනැගිල්ල ... | සමරකෝන් සහෝදරයෝ ... | 19,760 00 ... | සමරකෝන් සහෝදරයෝ |
| 7. | සිනමා පුස්තකාලයට වායු සමන යන්ත්‍රයක් සැපයීම සහ සවි කිරීම | සීමාසහිත බ්‍රවුන් සහ සමාගම<br>සීමාසහිත වෝකර් පුත්‍ර සහ සමාගම<br>සීමාසහිත රෝලන්ඩ්ස් සමාගම<br>සීමාසහිත වෝකර් සහ ග්‍රීග් සමාගම ... | 7,350 00 ... | සීමාසහිත බ්‍රවුන් සහ සමාගම |

1.9.60
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
කොළඹ 2.

එච්. ඩී. ඒ. විජයසිංහ,
ටැන්ඩර් මණ්ඩලයේ සභාපති.

---

## තැපැල් හා විදුලි සංදේශ දෙපාතර්මේන්තුව

**ටෙන්ඩර්කරුවන් :**

1. නෙල්සන් ඒජන්සීස්.
2. කොමර්ෂල් ඇඩ්වර්ටයිසින් කෝපරේෂන්.
3. සිලෝන් ඇන්ඩ් ඕවර්සීස් ට්‍රැවල් සර්විස්.
4. වී. සී. ඩී. එස්. විජේරත්න සහ පුත්‍රයෝ.

**සේවය :**

වසර තුනක කාල සීමාවකට තැපැල් කායඝාලීය ටෙලිෆෝන් නාමාවලියට දැන්වීම් සැපයීමේ අයිතිවාසිකම්.

**පිළිගත් ටෙන්ඩර්කරු හා මුදල :**

කොමර්ෂල් ඇඩ්වර්ටයිසින් කෝපරේෂන් මහතුන්—සියයට 14.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරල්.

60.9.1.

# විවිධ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

මෝටර් රථ, මෝටර් සයිකල්, මෝටර් ට්‍රක් රථ සහ ලොරි, ට්‍රැක්ටර්, ඇමුණු රථ, කුණු බාහකයක්, සතුන් විසින් අදිනු ලබන වාහන සහ ගුවන් නැව් ආදිය සඳහා ටයර් සහ ටියුබ් මෙරටට ගෙන්වන අය පහත සඳහන් කරුණු :—

(අ) සිරිත් පරිදි මෙරටට ගෙන්වා ගබඩා කර ඇති බඩු ප්‍රමාණ, හා

(ආ) මිල ලැයිස්තුවේ ගණන් හැර රජයේ ඇණවුම් වලට අඩු කළ හැකි වැඩිම වට්ටම/වට්ටම් පිළිබඳව සම්පූර්ණ විස්තර සහිතව තමන්ගේ අලුත්ම මිල ලැයිස්තුව අනුපිටපත සමග ඉදිරිපත් කරන ලෙස දන්වමි.

මිල ලැයිස්තු සහ වෙනත් විස්තර අනුපිටපත් සමග 1960 ඔක්තෝබර් 18 වෙනි අඟහරුවාදා පෙරවරු 9.30ට ප්‍රථම, මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත තැ. පෙ. 500, කොළඹ කියා එවිය යුතුයි. "ටයර් සහ ටියුබ් සඳහා ටෙන්ඩර්" කියාද කවරවල සඳහන් කරන්න.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 සැප්තැම්බර් 9 වෙනි දින,
කොළඹ.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.